## ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව - 2016

----------------------------------------------------

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනතේ 20(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-----

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

--------------------------------------

#### 2.2.1 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

--------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය .

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය තුල 2011 හා 2012 වර්ෂවල සිට පවතින රු.336,500 ක ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 24 වගන්තිය හා 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 වගන්තිය | සංස්ථාවේ සේවකයින් විසින් ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු සේවකයන්ගෙන් අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කරනු වෙනුවට සංස්ථා අරමුදලින් රු. 879,809 ක් සමාලෝචිත වර්ෂය සඳහා ගෙවා තිබුණි. පසුගිය වර්ෂවල විගණන වාර්තා මගින්ද මෙම කරුණ පෙන්වා දී තිබුණද ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

--------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.141,111,575 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.174,076,131 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 32,964,556 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රක්ෂණ වාරික ආදායම ඇතුළු මෙහෙයුම් ආදායම රු.31,958,052 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.145,304,938 ක් වූ අතිරික්තය උච්චාවචනයන් සහිතව සමාලෝචිත වර්ෂයේදී බදු වලට පෙර රු.156,111,575 ක් විය. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී සංස්ථාවේ දායකත්වය 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී සියයට 18 ක වර්ධනයක් හා 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ සියයට 20 ක වර්ධනයක් පෙන්නුම් කළද 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී එය සියයට 12 ක පිරිහීමක් බවට පත්ව තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

----------------

1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව සංස්ථාවේ අරමුණු පහත පරිදි වේ.

(අ) භාණ්ඩ හා සේවා අපනයනකරුවන්ට ලැබිය යුතු ගෙවීම් නොලැබීම හෝ ප්‍රමාදවීම සම්බන්ධයෙන් රක්ෂණ ඔප්පු නිකුත් කිරීම හා නැව්ගත කිරීමට පෙර හෝ නැව්ගත කිරීමෙන් පසු අවශ්‍ය මුදල්දීම පහසු කිරීම පිණිස මූල්‍ය ආයතනවලට ඇප නිකුත් කිරීම.

(ආ) ශ්‍රී ලාංකිකයෙකු විසින් කරන අපනයනවලදී ශ්‍රී ලංකාව තුළදී හෝ ඉන් පිටතදී ඉටු කළයුතු සේවා සඳහා අපනයනකරුවන්ට ඇප නිකුත් කිරීම, මුදලින් ආධාර දීම හා මූල්‍ය ආයතන දෙනු ලබන ණය පහසුකම් සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම.

(ඇ) විදේශීය රටවල ප්‍රවර්ධනාත්මක කටයුතුවලදී දැරීමට සිදුවිය හැකි පාඩු සම්බන්ධයෙන් ඇප සැලසීම හා අපනයන දියුණු කිරීම සඳහා විදේශවලදී අලෙවි අධ්‍යයන කටයුතු භාරගැනීම, විවිධ අංශ පිළිබඳ සම්මන්ත්‍රණ හා පාඨමාලා පැවැත්වීම සහ අලෙවි කිරීම සම්බන්ධ තොරතුරු රැස්කොට ප්‍රචාරය කිරීම.

(ඈ) රක්ෂණ හා ඇප සම්පාදනය, ජාතික සුභසිද්ධිය සඳහා අවශ්‍යයැයි ආණ්ඩුව විසින් සලකන වගකීම් භාරගැනීම හා ඉටුකිරීම, අපනයන විවිධාංගීකරණය, අපනයන පුළුල් කිරීමට හා අළුත් වෙළඳපළවල් සෙවීමට අපනයනකරුවන්ට උපකාරීවීම හා අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍යයැයි සංස්ථාව සැලකිය හැකි වෙනත් කර්තව්‍ය ඉටුකිරීම.

අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී සංස්ථාවේ රක්ෂණ ඔප්පු හා ඇප නිකුත්කිරීම්වලට අදාලව ක්‍රියාකාරී සැලැස්මේ වූ අපේක්ෂිත සංඛ්‍යාව හා තථ්‍ය සංඛ්‍යාව ඉකුත් වර්ෂයේ ප්‍රමාණයන් හා සැසදීමේදී සියළු රක්ෂණ ඔප්පු නිකුත් කිරීම් 2015 වර්ෂයේදී සියයට 41 සිට සියයට 68 ක පරාසයකින් අඩු වී තිබුණු අතර එය ප්‍රවර්තන වර්ෂයේදී සියයට 53 සිට සියයට 97 ක පරාසයකින් අඩු වී තිබුණි.

(ආ) සංස්ථාව ආරම්භ කර වර්ෂ 29 ක් ගතවී තිබුණද ආයතනික ධාරිතාව වර්ධනය උදෙසා බෙහෙවින් ඉවහල් වන හා ප්‍රධාන මෙහෙයුම් කාර්යයන්ගෙන් එකක් වන රක්ෂණ ඔප්පු හා ඇප වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා අත්පොතක් සකස් කිරීමේ කාර්යය සමාලෝචිත වර්ෂය තුලද ඉටුකිරීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) සංස්ථාවේ අභිවෘද්ධිය පිණිස ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය කර ගැනීම සඳහා බෙහෙවින් අවශ්‍ය වන කාර්යයක් ලෙස ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ECGC-(Export Credit Guarantee Corporation) ණය රක්ෂණ ඔප්පු නිකුත් කිරීමේ කටයුතු සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට ජාත්‍යන්තර ප්‍රජාවගේ තාක්ෂණික සහාය ලබා ගැනීම සමාලෝචිත වර්ෂය තුළදී ඉටුවී නොතිබුණි.

(ඈ) 2016 වර්ෂයේදී අපනයනකරුවන් 120 දෙනෙකුගෙන් මුළු රක්ෂණ වාරික ආදායම ලෙස රු.157,447,332 ක් ලැබී තිබූ අතර එයින් රු.121,908,362 ක් එනම් සියයට 77 ක් ලැබී තිබුණේ අපනයනකරුවන් 21 දෙනෙකුගෙනි. මුළු වාරික ආදායමින් රු.35,205,311 ක් හෙවත් සියයට 22 ක් ලැබී ඇත්තේ එක් අපනයනකරුවකුගෙන් වන අතර එම අපනයනකරුගෙන් පසුගිය වර්ෂයේ ලද රු.62,984,389 ක ආදායම සමාලෝචිත වර්ෂයේදී රු.27,779,078 කින් හෙවත් සියයට 11 කින් අඩුවී තිබුණි. එම නිසා සංස්ථාවේ පැවැත්ම හා ඵලදායීතාවය වර්ධනය කර ගැනීම උදෙසා අපනයනකරුවන් දැනුවත් කිරීමේ කටයුතු ප්‍රචලිත කිරීම හා ක්‍රමවත් කිරීම කාලෝචිත බව නිරීක්ෂණය කෙරේ.

(ඉ) අලෙවිකරණ අංශය මඟින් නිකුත් කරනු ලබන වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම සඳහා 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පමණක් වර්ෂයකට රු.75,000 බැගින් රු.225,000 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර සංස්ථාවේ ගනුදෙනුකරුවන් හා මූල්‍ය ආයතන ඇතුළු දෙස් විදෙස් බාහිර පාර්ශවයන් වෙත ඉදිරිපත් කරනු ලබන මෙම වාර්තාව යාවත්කාලීන වූ තොරතුරු ඇතුලත්ව, භාවිතා කරන්නන් හට ප්‍රයෝජනවත් වන පරිදි හරවත්ව කාලෝචිතව නිකුත් කළ යුතු වුවත් 2016 වර්ෂය දක්වා එම වර්ෂවලට අදාළ වාර්තා මුද්‍රණය කර නොතිබූ අතර 2015 වර්ෂයේ සිට ඒ සඳහා ප්‍රතිපාදනද සලසා නොතිබුණි.

## 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශීය භාණ්ඩ ගැණුම්කරුවෙකුගේ තත්ත්ව වාර්තාවල සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමකින් තොරව ප්‍රාග්ධනය EURO 116,000 කින් (රු.මිලියන 17 ක් පමණ) හා සේවකයන් දෙදෙනෙකුගෙන් සමන්විත අළුතින් ආරම්භ කරන තනි පුද්ගල ව්‍යාපාර ආයතනයකට සිදුකරන ලද අපනයන සඳහා අපනයනකරුවන් දෙදෙනෙකුට 2015 අප්‍රේල් 24 දින හා ජූනි 24 දින සිට බලපැවැත්වෙන පරිදි පිළිවෙලින් රු.මිලියන 6 ක් හා රු.මිලියන 6.5 ක් වශයෙන් රු.මිලියන 12.5 ක ණය සීමාවක් අනුමත කර තිබුණි. එක් අපනයනකරුවකුගේ ප්‍රථම අපනයනයට ද අනෙක් අපනයනකරු විසින් කරන ලද ප්‍රථම හා දෙවන අපනයනයන්ටද අදාලව එම විදේශීය ගැණුම්කරු විසින් මුදල් ගෙවීම් පැහැර හැරීම මත එම අපනයනකරුවන් වෙත පිළිවෙලින් රු.3,704,335 ක් හා රු.4,981,984 ක් ලෙස එකතුව රු.8,686,319 ක් වන්දි ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) නව ව්‍යාපාර ආයතනයක් වූ බ්‍රිතාන්‍ය ජාතික ව්‍යාපාරික ආයතනයක භාණ්ඩ ගැණුම්කරුවෙකුගේ ප්‍රාග්ධනය ස්ටර්ලින් පවුම් 1000 (රු.200,000 ක පමණ) ක්වූ අතර මුළු සේවක සංඛ්‍යාව 04 කට සීමාවී තිබුණි. ගැණුම්කරු සම්බන්ධයෙන් වූ තත්ත්ව වාර්තාවල තිබූ අවාසිදායක තත්ත්වයන් කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමු නොකර රු.15,000,000 ක ණය සීමාවක් ඒ සඳහා ලබාදී තිබුණි. අපනයනකරුගේ පළමු අපනයනයට අදාලව ගැණුම්කරු ගෙවීම් පැහැර හැරීම මත රු.9,504,000 ක් වන්දි ගෙවීමට සංස්ථාවට සිදුවී තිබුණි.

(ඇ) 1988 සැප්තැම්බර් 19 දිනැති අංක 7/88 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත සංස්ථාවේ සේවකයන්ගේ අභිවෘද්ධිය උදෙසා පැවති වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය සංශෝධනය කර තිබූ අතර මේ දක්වා අමාත්‍යාංශයේ අනුමැතියක් ඒ සඳහා ලබාගෙන නොතිබුණි. එමෙන්ම මෙම වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය කෙදිනක සිට කවර ආකාරයක අනුමැතියකින් ආරම්භ කළේද යන්න පිළිබඳ තොරතුරු ලිපිගොනුවේ නොතිබුණි. මෙම ප්‍රතිලාභ ක්‍රමය සඳහා සංස්ථාවේ සේවකයන්ගෙන් මාසිකව වැටුපෙන් රු.30 සිට රු.80 දක්වා මුදලක් පමණක් අයකරන අතර ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමේදී නිර්දේශය හා අනුමැතිය සංස්ථාවේ නිලධාරීන් තිදෙනෙක්ගෙන් සමන්විත වූ කමිටුවක් මඟින් සිදුකර තිබුණි. මෙම ප්‍රතිලාභ ක්‍රමය යටතේ සමාලෝචිත වර්ෂය තුලදී සංස්ථාවේ සේවකයන් 38 දෙනෙකු සඳහා රු.2,650,729 ක් ගෙවීම් කර තිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 වගන්තිය ප්‍රකාරව බඳවා ගැනීමේ පරිපාටිය හා උසස් කිරීමේ ක්‍රමවේදයන් සකස් කර නොතිබීම නිසා අවුරුදු 15 කට අධික සේවා පලපුරුද්දක් ඇති සුදුසුකම් සහිත නිලධාරින්ට පුරප්පාඩු තනතුරු සඳහා උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදයක් නොතිබුණි.

(ආ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අලෙවි) හා කළමනාකාර (අලෙවි) තනතුරු 2 ක් සඳහා පිළිවෙලින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්) හා විධායක (අලෙවි) යන නිත්‍ය තනතුරු දරන නිලධාරින් දෙදෙනෙකුට 2009 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් වන විටත් වැඩ බැලීමේ පත්වීම් ලබා දී ස්ථිර තනතුරේ ලබන වැටුපට අමතරව වැඩ බැලීමේ දීමනා ලෙස 2016 වර්ෂය සඳහා රු.420,547 ක් ගෙවා තිබූ අතර මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 ජුනි 06 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අංක 08 මගින් අනුමැතිය ලබා ගෙන 2014 මැයි 01 දින සිට වැටුප් සංශෝධනයක් කර තිබුණද 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන හා 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ අනුව ආයතනික ප්‍රතිව්‍යුහගතකරණය ජාතික වැටුප් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. තවද 2006 නොවැම්බර් 10 දිනැති අංක 06/2006 (ii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2009 ජුනි 01 දිනැති අංක 30(1) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි අවම වැටුප් පරිමාණයන් නොසලකා සංස්ථාවේ කළමනාකරණ සහකාර තනතුරු හා සම තත්ත්වයේ තනතුරු සඳහා වැටුප් පරිමාණයක් තීරණය කර ගෙවීම් කර තිබුණි.

# 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

## 5.1 සංයුක්ත සැලැස්ම

------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව සංස්ථාව විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

---------------------

2016 දෙසැම්බර් 31 දින තෙක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අභ්‍යන්තර විගණන තනතුරක් අනුමත කරවා ගෙන නොතිබුණ අතර 2012 පෙබරවාරි 10 දින සිට සංස්ථාවේ අභ්‍යන්තර විගණන කටයුතු කරගෙන යාම සඳහා පෞද්ගලික විගණන සමාගමක් පත් කර තිබූ අතර මෙම සමාගමට සමාලෝචිත වර්ෂය තුල රු. 281,194 ක් ගෙවා තිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

අයවැයගත සහ තත්‍ය ආදායම් හා වියදම් අතර සියයට 27 ක සිට සියයට 152 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | විදේශීය ගැණුම්කරුවන් ඇගයීමේ ක්‍රියාවලිය | තත්ත්ව වාර්තා ඇගයීමේදී හා ණය සීමා තීරණය කිරීමේදී ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබීම. |
| (ආ) | සේවක පරිපාලනය | සේවකයන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ කටයුතු විධිමත් නොවීම. |
| (ඇ) | මෙහෙයුම් පාලනය | ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක කරා ලඟා නොවීම. |